# 10. විදේශීය වෙළඳාම සහ සංචාරක කර්මාන්තය

ශ්‍රී ලංකාවෙහි අපනයනය 2000 වර්ෂය මුළුල්ලෙහිම සැළකිය යුතු අන්දමින් වර්ධනය විය. කෙසේ වුවද, ඛනිජ තෙල්වල මිල ඉහළ යෑමේත්, ආරක්ෂක කටයුතු සඳහා කරන ලද ආනයන ඉහළ යෑමේත් ප්‍රතිඵලයක් ලෙස ආනයන වියදම් අසාමාන්‍ය ලෙස ඉහළ යෑම හේතුකොට වෙළඳ ශේෂය පුළුල් විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

- ▲ 2000 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ අපනයන ඉපයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,522 ක්ව, 1999 වසරට වඩා සියයට 20 ක වැඩි වීමක් වාර්තා කළේය. රෙදිපිළි හා ඇඟළුම්, තේ, යන්ත්‍රසූත්‍ර, කාර්මික හා විදුලිමය උපකරණ, රබර් පදනම් කරගත් භාණ්ඩ, මත්ස්‍ය නිෂ්පාදන, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයනය මෙම වර්ධනයට මූලික වශයෙන් දායක විය.

- ▲ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදනය මුළු අපනයන ආදායමින් සියයට 54 කට දායක විය. ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපීය රට වලින් ඇති වූ ඉහළ ඉල්ලුම නිසා රෙදිපිළි හා ඇඟළුම් අපනයනය සියයට 23 කින් වැඩි විය.

- ▲ දෙවන විශාල අපනයනය වූ තේ වලින් ලත් අපනයන ඉපයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 700 දක්වා සියයට 13 කින් ඉහළ නැගුණි. රුසියාව හා මැද පෙරදිග රට වලින් ඉහළ ඉල්ලුමක් ඇති වීම මෙම වර්ධනයට හේතු විය. 1999 දී එ.ජ.ඩොලර් 2.30 ක්ව පැවති තේ කිලෝවක මිල 2000 දී කිලෝ 1 ක් එ.ජ.ඩොලර් 2.43 දක්වා වැඩි විය.

- ▲ ඇමෙරිකා එක්සත් ජනපදය, ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ ආනයනය කරන රටවල් අතරින් ප්‍රධාන ස්ථානය (සියයට 40) තවදුරටත් පවත්වා ගැනීමට සමත් විය. ශ්‍රී ලංකාව ඇමෙරිකා එක්සත් ජනපදයට ප්‍රධාන වශයෙන් ඇඟළුම් (සියයට 77) අපනයනය කරයි. 2000 වසර තුළ එක්සත් රාජධානිය (සියයට 13.5) ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන දෙවන විශාලතම රට වූ අතර ජර්මනිය (සියයට 4) තෙවන විශාලතම රට විය.

අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය




10.1 රූපසටහන

අපනයන සංයුතිය - 2000




10.2 රූපසටහන

### ආනයන වියදම

▲ 2000 වසර තුළ ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7,320 ක්ව, 1999 වසරට වඩා සියයට 22 කින් වැඩි විය. මෙයට 1999 හා 2000 වසර තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගම මගින් ආනයනය කරන ලද ගුවන්යානාද ඇතුළත් වේ. වසර දෙක තුළම ආනයනය කරන ලද ගුවන්යානා අත්හල පසු ආනයනයන්හි වර්ධනය සියයට 24 ක් වේ. ගුවන්යානා අත්හල පසු, 1999 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,682 ක්ව පැවති ආනයන වියදම හා සැසඳීමේදී 2000 වසර තුළ ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7,022 ක් වේ.

▲ ආනයන, පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ යනුවෙන් වර්ගීකරණය කරනු ලබයි. 2000 වසර තුළ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 12 කින් වැඩි විය. සහල් ආනයන වියදමෙහි අඩු වීම නිසා ඇති වූ බලපෑම සමහන් කරමින් සීනි, තිරිඟු, කිරි නිෂ්පාදන හා වෙනත් ආහාර වර්ග සඳහා ආනයන වියදම ඉහළ යෑම නිසා මෙම කාණ්ඩය තුළ ආහාර පාන වර්ග ආනයනය සියයට 5 කින් වැඩි විය. බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, මෝටර් කාර් හා යතුරු පැදි, ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනි යන්ත්‍ර, ප්ලාස්ටික්, මුද්‍රිත පොත් සඳහා පැවති ඉහළ ආනයන වියදම හේතුකොට කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන වියදම සියයට 20 කින් වැඩි විය.

▲ ඛණිජ නිෂ්පාදිත, රෙදිපිළි, පොහොර, දියමන්ති හා වෙනත් අන්තර් භාණ්ඩයන්හි ආනයනයන් ඉහළ යෑම නිසා අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 24 කින් වැඩි විය. 2000 වසර තුළ ආනයනය කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදන අත්හල පසු අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 13 කින් වැඩි විය.

ආනයන වියදම්




*10.3 රූපසටහන*

සංචාරක පැමිණීම්




*10.4 රූපසටහන*

▲ 2000 වසර තුළ ආයෝජන භාණ්ඩ ආනයන වියදම සියයට 11 කින් වැඩි විය. කෙසේ නමුදු යන්ත්‍රසූත්‍ර හා උපකරණ (සියයට 16) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය (සියයට 17) යන්හි ඉහළ වර්ධනයක් පිළිබිඹු කරමින් 2000 වසර තුළ ආනයනය කරන ලද ගුවන්යානා අත්හල පසු ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 14 කින් වැඩි විය.

▲ ජපානය ශ්‍රී ලංකාවට භාණ්ඩ අපනයනය කරන ප්‍රධාන රට ලෙස (සියයට 10) නොකඩවා පැවති අතර ඉන්දියාව (සියයට 9.5) සහ හොංකොං (සියයට 8) යන රටවල් පිළිවෙලින් දෙවන හා තුන් වන ස්ථාන හිමි කර ගත්තෝය.

වෙළඳ ශේෂය

▲ 1999 වසරේ වෙළඳ ශේෂය වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,369 හා සැසඳීමේදී 2000 වසරේ වෙළඳ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,798 දක්වා පුළුල් විය. වර්ෂ දෙක තුළම ආනයනය කරන ලද ගුවන්යානා අත්හල පසු 1999 වසරේ වෙළඳ ශේෂය වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,072 හා සැසඳීමේදී 2000 වසරේ වෙළඳ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,500 ක් විය.

සංචාරක කර්මාන්තය

▲ 2000 වසර තුළ සංචාරක පැමිණීම් අඩු විය. 2000 වසර තුළ සංචාරක පැමිණීම් 400,414 ක්‍ව පෙර වසරට වඩා සියයට 8 කින් අඩු විය. රට තුළ පැවති අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වය මෙම අඩු වීමට හේතු විය.

▲ 1999 දී පැවති එ.ජ.ඩොලර් දශ ලක්ෂ 274 හා සැසඳීමේදී සංචාරක කර්මාන්තයෙන් ලත් දළ ඉපයීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 252 දක්වා 2000 දී අඩු විය.